# අංගන ප්‍රශස්තිකරණ ආඥා පනත

## (චිබා ප්‍රාන්තයේ මෝටර් රථ කොටස් ක්‍රමවත්ව ගබඩා කිරීම)

අංගන තුළ ඇති මෝටර් රථ කොටස් වලින් අවට ප්‍රදේශයට තෙල් ආදිය කාන්දු වන අවස්ථා මෙන්ම සොරකම් වැනි නීති විරෝධී ලෙස අත්පත් කර ගත් මෝටර් රථ අමතර කොටස් අංගන තුළ ගබඩා කර ඇති අවස්ථා තිබේ.

එබැවින්, චිබා ප්‍රාන්ත වැසියන්ගේ ජීවන පරිසරය ආරක්ෂා කිරීම සහ සාමකාමී ජන ජීවිතයක් සහතික කිරීම සඳහා, අංගන ප්‍රශස්තිකරණ ආඥා පනත (පොදු නාමය) ස්ථාපිත කරන ලදි (බලාත්මක කළේ වර්ෂ 2015 අප්‍රියෙල් 1 දින).

අංගන පවත්වාගෙන යන අය එක් එක් අදාළ නීති වගන්ති වල නියමයන්ට අමතරව මෙම නව ආඥා පනතේ නීතිරීතිවලට ද අනුකූල විය යුතුය.

එමෙන්ම මෙහිදී,අංගනය පවත්වාගෙන යන අය සහ එම ඉඩම් සපයන අයගේ සහයෝගය ද අපි අගය කරමු.

- ◆චිබා ප්‍රාන්තයේ අංගන වල වාහන කොටස් ගබඩා කිරීම හෝ කොටස් කිරීම නියාමනය කරන **රෙගුලාසි බලාත්මක කළ දිනය වර්ෂ2015 අප්‍රේල් 1** වේ.
- ◆**මේ වන විටත් මෝටර් රථ අමතර කොටස් ගබඩා කර හෝ කොටස් වෙන් කර ඇති අයෙක් වුවද මෙම නියාමනයට** යටත් වේ.
- ◆මෙම ආඥා පනතේ විධි විධාන වලට යටත් වන **「අංගනය」 යනු එන්ජින් එමෙන්ම ප්‍රොපෙලර් ෂාෆ්ට් වැනි මෝටර් රථ කොටස් ගබඩා කිරීම හෝ කොටස් වෙන් කිරීම සඳහා භාවිතා කරන ස්ථානයක්** වේ.
  මෙහි අවට වැටක් හෝ බහාලුමක් ඇත්නම් ඒවා ද නියාමනයට යටත් වේ.
- ◆නිදසුනක් ලෙස, මෝටර් රථ ප්‍රතිචක්‍රීකරණ නීතිය යටතේ අවසර පත්‍රයක් අවශ්‍ය නොවන **දෙකට කැපූ මෝටර් රථ වලින් කොටස් වෙන් කිරීමේ කටයුත්ත ද මෙම ආඥා පනතේ නීතිරීති වලට** යටත් වේ.

චිබා ප්‍රාන්තය

## අංගනයක් යනු ?

මෙම ආඥා පනතේ නීතිරීති වලට අදාළ වන 「අංගනය」 යනු එන්ජින් එමෙන්ම ප්‍රොපෙලර් ෂාෆ්ට් වැනි මෝටර් රථ කොටස් ගබඩා කිරීම හෝ කොටස් වෙන් කිරීම සඳහා භාවිත කරන ස්ථානයක් වේ.

**මතක තබා ගත යුතු කරුණු**

- අවට කොටසක වුව වැටක් හෝ බහාලුමක් ඇත්නම්, සම්පූර්ණයෙන්ම කොටු කර නොතිබුණද එය මෙම නියාමනයට යටත් වේ.
- ඔබ ව්‍යාපාරයක් ලෙස කටයුතු නොකරන්නේ නම්, වර්ග මීටර්300 ට වඩා අඩු ඉඩම් මෙයට අදාළ නොවේ. කෙසේ වෙතත්, ව්‍යාපාරයක් කරන විට, භූමි ප්‍රමාණය නොසලකා සියල්ල නියාමනයට යටත් වේ.
- යතුරුපැදි වැනි කොටස් මෙම ආඥා පනතේ නීතිරීති වලට අදාළ නොවන නමුත් පාවිච්චි කරන ලද මෝටර් රථවල කොටස් ද භාවිත වේ නම් ඒවා මෙම නීතිරීති වලට යටත් වේ.
- දෙකට කැපූ මෝටර් රථ ගබඩා කිරීම ද මෙම ආඥා පනතේ නීතිරීති වලට යටත් වේ.
- මෙම ආඥා පනත,සාමාන්‍ය රීතියක් ලෙස,මාර්ගස්ථ ප්‍රවාහන නීතියෙන් අනුමත කර ඇති මෝටර් රථ කොටස් කිරීම සහ නඩත්තු කිරීමේ ව්‍යාපාර සම්බන්ධව අදාළ නොවේ.

## දැනුම් දීමේ වගකීම

ඔබ අංගනය තුළ ඇති මෝටර් රථ කොටස් වෙන් කිරීමට හෝ ගබඩා කිරීමට අදහස් කරන්නේ නම්, මෙම කටයුතු ආරම්භ කිරීමට පෙර, ඔබ ඒ බව ආණ්ඩුකාරවරයාට දැනුම් දිය යුතුය.

ඔබ දැනටමත් මෙම කටයුතු ආරම්භ කර ඇත්නම් රෙගුලාසි ක්‍රියාත්මක කිරීම පිණිස, (වර්ෂ2015 ජූනි 30 දිනට පෙර) ඔබ ඒ බව ආණ්ඩුකාරවරයාට දැනුම් දිය යුතුය.

**මතක තබා ගත යුතු කරුණු**

- සාමාන්‍ය රීතියක් ලෙස, මෝටර් රථ ප්‍රතිචක්‍රීකරණ නීතියනේ  කොටස් වෙන් කිරීමට බලය ලබා ඇති අයට මෙම වගකීම අදාළ නොවේ.
- දැනුම් දීමේ පෝරමය පිටපත්  දෙකකි. විස්තර කළ යුතු අයිතම අතර අංගනයේ පිහිටීම, විශාලත්වය, තිබෙන දේවල් සහ තෙල් පිටවීම වැළැක්වීම සඳහා ගත යුතු පියවර ආදිය ඇතුළත් වේ. ඇමිණියයුතු ලියකියවිලි ලෙස බිම් සැලසුම් සහ අංගනය භාවිතා කිරීමේ අයිතිය සනාථ කරන ලියකියවිලි ආදිය ඇතුළත් වේ.
- දැනුම් දීමෙන් පසු යම් වෙනසක් සිදුකර ඇත්නම් හෝ එය අත්හිටුවා හෝ අහෝසි කර ඇත්නම්, ඒ බව ඔබ ආණ්ඩුකාරවරයාට දැනුම් දිය යුතුය.
- දැනුම් දෙන්නා,සෑම අංගනයක් සඳහාම,දැනුම් දීමේ අංක සහ සලකුණු ඉදිරිපත් කළ යුතුය.

## තෙල් ආදිය කාන්දුවීම වැළැක්වීමේ වගකීම

මෝටර් රථ අමතර කොටස් වලින් වෑහෙන තෙල් අංගනයේ භූගතව විනිවිද නොයන ලෙස බිම ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් වලින් සාදා ගත යුතුය.

මෝටර් රථ අමතර කොටස්වල තෙල් ආදිය අංගනයෙන් කාන්දුවීම වැළැක්වීම සඳහා වහල, ආවරණ ආදිය යෙදිය යුතුය.

ඔබ දැනටමත් අංගනයේ මෝටර් රථ කොටස් ගබඩා කර හෝ වෙන් කර ඇත්නම්, මෙම ආඥා පනත ක්‍රියාත්මක කිරීමේදී, වර්ෂ2015 ජූනි 30 දිනට පෙර මෙම පියවර ගත යුතුය.

**මතක තබා ගත යුතු කරුණු**

- සාමාන්‍ය රීතියක් ලෙස, මෝටර් රථ ප්‍රතිචක්‍රීකරණ නීතියනේ කොටස් වෙන් කිරීමට බලය ලබා ඇති අයට මෙම වගකීම අදාළ නොවෙන නමුත්, මෝටර් රථ ප්‍රතිචක්‍රීකරණ නීතිය මත පදනම්ව එම වගකීම ඉටු කළ යුතුය.

## ප්‍රයිම් මුවර්ස් (එන්ජින් සහ මෝටර) වෙළඳාම් කිරීම සම්බන්ධ වගකීම්

එන්ජින් සහ මෝටර ලබා ගැනීමේදී, අනෙක් පාර්ශවයේ වෙළඳ නියෝජිතගේ නම සහ ලිපිනය පරීක්ෂා කළ යුතුය.

ඔබ එන්ජින් සහ මෝටර ලබා ගැනීමේදී,එන්ජිම යනාදිය සොරකම් කර ඇති ඒවා බවට සැක කරන්නේ නම්, ඒබව වහාම පොලිසියට වාර්තා කළ යුතුය.

ඔබ එන්ජින් සහ මෝටර ගනුදෙනු පිළිබඳ වාර්තාවක් සකස් කර වසර තුනක් තැන්පත් කර තබා ගත යුතුය.

**මතක තබා ගත යුතු කරුණු**

- පැරණි භාණ්ඩ ව්‍යාපාර නීතියෙන් බලයලත් පරණ බඩු ව්‍යාපාරිකයන් සම්බන්ධව ඉහත කී නීතිය සමඟ ගැළපෙන කොටස් අදාළ නොවේ.එහෙත් ඔවුන් පැරණි භාණ්ඩ ව්‍යාපාර නීතිය මත පදනම්ව වගකීම් ඉටු කළ යුතුය.
- සාමාන්‍ය රීතියක් ලෙස, ගනුදෙනු භාරව සිටින නිලධාරියාගේ නම, ලිපිනය යනාදිය නීති රීති මගින් නිශ්චිතව දක්වා ඇති ක්‍රමවේදය මගින් සනාථ කළ යුතුය (පැරණි භාණ්ඩ ව්‍යාපාරිකයා පැරණි භාණ්ඩ ව්‍යාපාර නීතියෙන් අපේක්ෂා කරන තහවුරු කිරීමේ ක්‍රමයට අනුගත වියයුතුය.)
- රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ලෙස 「මෝටර් එන්ජින් ගනුදෙනු වාර්තා පොත」 හි වාර්තා තැබිය යුතුය. එයට ගනුදෙනු කළ දිනය, එන්ජින් සහ මෝටර වල වර්ගය,විශේෂතා, ගනුදෙනුවේ ප්‍රති පාර්ශ්වය සහ ගනුදෙනුව භාරව සිටි පුද්ගලයා ආදිය ඇතුළත් වේ.

## ඉඩම් හිමිකරුවන් සහ අංගන පිහිටුවන්නන්ගෙන් කෙරෙන ඉල්ලීම

ඔබට ඉඩමක් හෝ අංගනයක් කුලියට දීමේදී හෝ විකිණීමේදී, එය නීති විරෝධී ලෙස භාවිතා නොකෙරන බවට තහවුරු ගතයුතුය.

ඔබ කුලියට දුන් ඉඩම හෝ අංගනය නීති විරෝධී ලෙස භාවිතා කෙරෙන බව ඔබට වැටහේ නම්, අදාළ ආයතනවලට දන්වන්න.

## උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම

අවශ්‍ය නම්, අංගනයට ඇතුල්වී ප්‍රශ්න ඇසීම සහ විමර්ශන කිරීම.

ඔබ මෙම ආඥා පනතේ නීතිරීති උල්ලංඝනය කරන්නේ නම්, ඔබට වසරක සිරදඬුවමක් නියම කළ හැකිය.

**මතක තබා ගත යුතු කරුණු**

- ස්ථානීය පරීක්ෂණයකදී පොලිස් නිලධාරීන් ඔබ සමග පැමිනෙණ අවස්ථා ද තිබේ.

### විමසීම්

- **අංගන ප්‍රශස්තිකරණ රෙගුලාසි සම්බන්ධ සාමාන්‍ය**
  චිබා ප්‍රාන්ත ජීවන පාරිසරික කටයුතු දෙපාර්තමේන්තුව අංගන සහ අතහැර දැමූ ඉඩම් ප්‍රතිම්නුම් කණ්ඩායම
  මෝටර් රථ සහ අංගන ප්‍රතිම්නුම් අංශය ☎0 4 3 – 2 2 3 – 4 7 2 2
  ප්‍රාදේශීය ප්‍රවර්ධන කාර්යාල

- **මෝටර් රථ ප්‍රතිචක්‍රීකරණ නීති සම්බන්ධ**
  චිබා ප්‍රාන්ත ජීවන පාරිසරික කටයුතු දෙපාර්තමේන්තුව අංගන සහ අතහැර දැමූ ඉඩම් ප්‍රතිම්නුම් කණ්ඩායම
  මෝටර් රථ සහ අංගන ප්‍රතිම්නුම් අංශය ☎0 4 3 – 2 2 3 – 4 6 5 8
  දේශීය ප්‍රවර්ධන කාර්යාල
  රජය විසින් නම් කරන ලද නගර・ප්‍රධාන නගර

- **පැරණි භාණ්ඩ ව්‍යාපාර නීතිය සම්බන්ධ**
  චිබා ප්‍රාන්ත පොලිස් මූලස්ථානය, පුරුදු සහ ආරක්ෂණ අංශය
  ☎0 4 3 – 2 0 1 – 0 1 1 0(පොදු)

- **අංගනවල සිදුවන අපරාධ සම්බන්ධ සාමාන්‍ය**
  චිබා ප්‍රාන්ත පොලිස් මූලස්ථානය,ජාත්‍යන්තර විමර්ශන අංශය
  ☎0 4 3 – 2 0 1 – 0 1 1 0(පොදු)
  සියලුම පොලිස් ස්ථාන